www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

*ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරනය:*

# ශ්‍රීලනිප අපේක්ෂකයා වාර්ගික ප්‍රචන්ඩත්වය හා යුද්ධය අවුලුවන ප්‍රකාශනයක් නිකුත් කරයි

**Sri Lankan presidential election:**
**SLFP candidate issues a manifesto for communal violence and war**

**සමාජවාදී සමානතා පක්ෂයේ ජනාධිපති අපේක්ෂක විජේ ඩයස් විසිනි**
**2005 නොවැම්බර් 2**

නොවැම්බර් 17 දා පැවැත්වෙන ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරනයට තරග වදින ප්‍රධාන ධනේශ්වර පක්ෂ දෙකේ අපේක්ෂකයෝ -- ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) අගමැති මහින්ද රාජපක්ෂ සහ එක්සත් ජාතික පක්ෂයේ (එජාප) විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ -- දීර්ඝ මැතිවරන පොරොන්දු ලැයිස්තු සහිත ප්‍රකාශන දෙකක් නිකුත් කර ඇත.

අන්ත මෝඩයන් ම පමනක් මෙම හිස් පොරොන්දු විශ්වාස කරනු ඇත. රාජපක්ෂ දුන් පෙනී සිටින්නේ මහජනතාවගේ සියලු ම ගැටලු විසඳාලන මැජික් පොල්ලක් අතින් ගෙන යලි ඉපදුනු සාන්තුවරයකු ලෙස ය. කෙසේ වෙතත්, 1994 සිට ඔහුගේ ශ්‍රීලනිපය, එජාපය විසින් හඳුන්වා දෙනු ලැබූ විවෘත වෙලඳ පොල ආර්ථික පිලිවෙත් ඉදිරියට ගෙන ගිය සභාග ආන්ඩුවලට නායකත්වය දී ඇති අතර, එනයින් ගත් කල විදේශ හා දේශීය ආයෝජකයන්ගේ වාසිය තකා වැඩ කරන ජනතාව මත පටවන ලද සමාජ ව්‍යසනය සම්බන්ධයෙන් වගකීම බෙදා හදා ගනී.

එජාපය හා ශ්‍රීලනිපය 1948 නිදහසේ පටන් මෙම දිවයින පාලනය කොට -- එජාපය වසර 34ක් ද ශ්‍රීලනිපය වසර 22ක් ද වසයෙන් -- එක් ව්‍යසනයකින් පසුව තවත් ව්‍යසනයක් බැගින් නිර්මානය කර ඇත. පුලුල්ව පැතුරුනු දරිද්‍රතාව තව දුරටත් දරුනු වන අතර දිවයිනේ පවත්නා සීමිත පොදු අධ්‍යාපන, සෞඛ්‍ය හා සුභසාධන සේවාවන් පුද්ගලික ලාභ ගරන ආයතනවලට මාවත සකසනු වස් කප්පාදුවට ලක් කෙරෙමින් ඇත. දේශපාලන විරුද්ධත්වයට ප්‍රතිචාර වසයෙන් පක්ෂ දෙකම කර ඇත්තේ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට අබන්ඩව පහර දෙමින් කම්කරු පන්තිය භේද කරනු පිනිස දෙමල විරෝධී ස්වෝත්තමවාදය ඇවිලවීම යි.

ප්‍රතිඵලය වූයේ දිවයින මත සිංහල බෞද්ධ දේශපාලන අධිපතිවාදය පවත්වා ගැනීමේ එල්ලයෙන් යුත් ව්‍යසනකාරී 20 අවුරුදු සිවිල් යුද්ධයකි. ජීවිත 60,000කට වඩා බිලි ගනිමින්, ඊටත් වඩා විශාල සංඛ්‍යාවකට තුවාල සිදු කරමින් හෝ අංගවිකල තත්වයට පත් කරමින් සහ දශ ලක්ෂයකට වැඩි සංඛ්‍යාවක් එක්කෝ විදේශ රටවල නැති නම් රට තුල සරනගත කඳවුරු තුල අවතැන් වූවන් බවට පත් කරමින්, 1983 සිට 2002 දක්වා දිවයින ලේ විලක ගිල්වූ ආන්ඩුවල කැබිනට් ඇමතිවරුන් ලෙස වික්‍රමසිංහ සහ රාජපක්ෂ යන දෙදෙනා ම ක්‍රියා කර ඇත.

පෙර දැකිය හැකි ලෙස ම, මහින්ද චින්තන ලෙසින් මාන්නක්කාර අයුරින් නම් කර ඇති රාජපක්ෂගේ මැතිවරන ප්‍රකාශනය තුල, යුද්ධය පිලිබඳ ප්‍රධාන ප්‍රශ්නය පසුපසට තල්ලු වී 30 වන පිටුවට සීමා වී ඇත. එය පෙර දැකිය හැකි වන්නේ, සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය සමග තමන් ඇති කර ගෙන තිබෙන මැතිවරන ගිවිසුම්, ඡන්දදායකයන් අති මහත් බහුතරයක් අකමැති දෙයක් වන යුද්ධය යලි ඇවිලවීම සඳහා මාවත සකසන පිලිවෙත්වලට ඔහුව ගැට ගසන්නේ ය යන කරුන යට ගැසීමට අගමැතිවරයාට අවශ්‍ය බැවිනි.

දෙසැම්බර් 26 සුනාමියෙන් විපතට පත්ව දිවි ගලවා ගත් ජනයා වෙනුවෙන් පුනරුත්ථාපන වැඩ කටයුතු ඒකාබද්ධව මෙහෙයවීම පිනිස දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින් ඇති කර ගැනුනු, ඇගේ අගමැති රාජපක්ෂගේ ද අනුමැතිය ලද ගිවිසුමට එරෙහිව විරෝධය දක්වමින් ජූනි මස ඔවුන් ආන්ඩුවෙන් ඉවත් වන තෙක් ම ජවිපෙ ශ්‍රීලනිප නායකත්වයෙන් යුත් පාලක සභාගයේ කොටස්කරුවකුව සිටියේ ය. සැලකිය යුතු ක්‍රියාකාරි පදනමක් සහිත ජවිපයේ සහයෝගය ලබා ගැනීම වෙනුවෙන් මංමුලා සහගත වී සිටි රාජපක්ෂ, සුනාමි ආධාර ගිවිසුම ප්‍රතික්ෂේප කරන, සටන් විරාමය යලි සාකච්ඡා කල යුතු යැයි ඉල්ලා සිටින සහ සන්නද්ධ හමුදා ශක්තිමත් කල යුතු යැයි කියා සිටින මැතිවරන ගිවිසුමක් අත්සන් කලේ ය.

එහි ප්‍රතිවිපාකයක් ලෙස, ජවිපෙ, වාර්ගික මනෝගතීන් අවුස්සමින් හා රාජපක්ෂගේ සීනි බෝල මැතිවරන පොරොන්දු තොරොම්බල් කරමින්, ඔහුගේ මැතිවරන ව්‍යාපාරය තුල ප්‍රධාන ක්‍රියා කලාපයක් ඉටු කරයි. ජවිපෙ වාචාල ප්‍රචාරක ලේකම් විමල් වීරවංශ රාජපක්ෂගේ මැතිවරන ව්‍යාපාරයේ සම-කලමනාකරුවකු ලෙස පත් කර තිබේ. සිය එකදු සාමාජිකයකු වත් මැතිවරනයට තරග නො කරන නමුදු ජවිපෙට ජනාධිපති අපේක්ෂකයෙක් සිටී යැයි සමහර දේශපාලන අටුවාකරුවන් විහිලු සහගත ලෙස පවා පවසා ඇත.

ඇත්ත වසයෙන් ගත් කල, රාජපක්ෂගේ මැතිවරන ප්‍රකාශනය, වික්‍රමසිංහ ආන්ඩුව හා එල්ටීටීඊ විසින් 2002 පෙබරවාරියේ දී අත්සන් කරන ලද සටන් විරාම ගිවිසුමක් මගින් ආකාරගතව අවසන් කෙරුනු යුද්ධය යලි ඇරඹීම සඳහා විවෘතව කැඳවුම් කරන්නේ නැත. කෙසේ වෙතත්, සාම සාකච්ඡා යලි ඇරඹීම පිනිස රාජපක්ෂ විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති කොන්දේසි සම වන්නේ, එල්ටීටීඊයට පිලිගත නො හැකි අවසන් නිවේදනයකි. එනයින් ඒවා යුද්ධය යලි ඇවිලීම සඳහා පදනම සකසයි.

“මහින්ද චින්තනයේ” “සාමය” පිලිබඳ කොටස ජවිපෙ ප්‍රචාරක පත්‍රිකාවකින් කෙලින් ම ඉරා ගත් කොලයක් වැනි ය. “දුර දිග නො බලා කිසිදු ඉදිරි දැක්මකින් තොරව හදිසියේ” සටන් විරාම ගිවිසුමක් අත්සන් කිරීමත් එමගින් “ජාතික ආරක්ෂාව අනතුරේ හෙලීමත්” පිලිබඳව එය වික්‍රමසිංහට චෝදනා කලේ ය. “එකී සම්මුති අප රටේ ජනතාව මත පැටවීමට උත්සාහ කෙරුනු අතර දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය ඒ සම්මුතිවලින් ඉවත් විය. දැන් ඇතමුන් උත්සාහ කරන්නේ ඒ අසාර්ථක වූ පැරනි මාර්ගයේ ම ඒ අසාර්ථක වූ තැනින් ම පටන්ගෙන ඉදිරියට යෑමට ය.” යනුවෙන් එය සඳහන් කරයි.

ප්‍රකාශනයේ අඩංගු විශේෂයෙන් නරුම වෙස් ගත් ඡේදයක් මෙසේ අනතුරු අඟවයිඃ “එහි අවසාන ප්‍රතිඵලය වනු ඇත්තේ තිරසාර සාමයක් ඇති වීම නො ව දූනට අවි අතට නො ගෙන ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරමින් ඇති පිරිස් ද අවි අතට ගැනීම දක්වා තල්ලු කිරීම යි.” මෙය අර්ථදක්විය හැක්කේ, වත්මන් සටන් විරාමයට එරෙහිව ප්‍රචන්ඩ ව්‍යාපාරයක් ගෙන යන බවට රාජපක්ෂගේ හවුල්කරුවන් -- ජවිපෙ හා හෙල උරුමය -- විසින් කෙරුනු තර්ජනයක් ලෙස ම පමනි. මෙහි දී මතකයට නගා ගත යුත්තේ, දැන් පාර්ලිමේන්තුවේ සිටින ජවිපෙ, යුද්ධය අවසන් කිරීමට දැරුනු මුල් ම අසාර්ථක ප්‍රයත්නය වූ ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහිව එය ගෙන ගිය ෆැසිස්ට් මෙහෙයුම තුල දී, 1987-89 කාල පරිච්ඡේදයේ දී කම්කරුවන් හා දේශපාලන විරුද්ධවාදීන් බුරුතු පිටින් මරා දැමූ බව යි.

2002 සටන් විරාමයෙන් ආරම්භ කොට එල්ටීටීඊය සමග සාම ගිවිසුමකට එලඹීමට වික්‍රමසිංහ දරූ ප්‍රයත්නයන් ද මීට සමාන බාධකවලට මුහුන දුනි. ඊනියා සාම ක්‍රියාදාමය, ගෙන යනු ලැබුවේ කිසි දාක දෙමල, සිංහල හා මුස්ලිම් සාමාන්‍ය වැඩ කරන ජනතාව මත යුද්ධය ඇති කල ව්‍යසනකාරී බලපෑම පිලිබඳ මොන යම් හෝ උත්සුකතාවකින් නම් නො වේ. ඒ වෙනුවට, එජාපය ප්‍රතිචාර දැක්වූයේ භූගෝලීය නිෂ්පාදන ක්‍රියාදාමයන්ට දිවයින ඒකාග්‍ර කිරීමේ සැලසුම්වලට බාධාවක් බවට පත්ව තිබූ යුද්ධය අවසන් කරන ලෙස මහ බලවතුන් හා කොලඹ සංගත කවයන් වෙතින් එල්ල වූ පීඩනයට ය.

ජනාධිපති කුමාරතුංග, මිලිටරියේ කොටස්වල හා ජවිපෙයේ පිටුබලය ද සහිතව, “ජාතික ආරක්ෂාව සම්මුති ගස්වන” පියවරක් ලෙස සටන් විරාමය හෙලා දැක්කේ, ස්වෝත්තමවාදී දේශපාලනය මත පාලක ප්‍රභූවේ රඳා පැවැත්ම ද වාර්ගික ගැටුමට ප්‍රජාතන්ත්‍රවාදී විසඳුමක් සොයා ගැනීමෙහි ලා එයට පවත්නා ඓන්ද්‍රීය නො හැකියාව ද පිලිබිඹු කරමිනි. ශ්‍රීලනිපය ජවිපෙ සමග සන්ධානගතව පසු ගිය වසරේ මහ මැතිවරනය යන්තමින් ජය ගත් කල, කුමාරතුංග අංශක 180ක හැරීමක් ගෙන “සාම ක්‍රියාදාමය” යලි ඇරඹීම සඳහා කැඳවුම් කලා ය. එය ද වික්‍රමසිංහට වඩා සාර්ථකත්වයක් අත්පත් කර ගත්තේ නැත.

රාජපක්ෂ දැන් යෝජනා කරන්නේ, “නොබෙදුනු රටක්, බහුතර සම්මුතියක් සහ ගෞරවනීය සාමයක්” මත පදනම්ව සියලු ම පක්ෂවලට ආරාධනා කෙරෙන වට මේස සමුලු දෙකක් ද ඇතුලත් “නැවුම් ප්‍රවේශය”කි. “එකඟතා නැති ප්‍රශ්න සඳහා ජාතික සම්මුතියක් ඇති කර ගැනීමට මම පියවර ගන්නෙමි. එම ජාතික සම්මුතියේ දී ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වයත් භෞමික අඛන්ඩතාවත් ඒකීය රාජ්‍ය ව්‍යුහයත් ජනතාවගේ ජාතික අනන්‍යතාවත් ඔවුන් අතර සාමකාමී සහජීවනයත් ආරක්ෂා විය යුතු බව මගේ පිලිගැනීම යි.” යනුවෙන් ඔහුගේ මැතිවරන ප්‍රකාශනය සඳහන් කරයි.

මෙම “නැවුම් ප්‍රවේශයේ” අලුතින් කිසිවක් නැත. “ජාතික ඒකමතික භාවයක්” සඳහා එය කරන ආයාචනය වනාහි දෙමල සුලුතරයේ වියදමින් සිය ආධිපත්‍යය පවත්වා ගෙන යාම පිනිස සිංහල බෞද්ධ ප්‍රභූන් විසින් දිගු කලක් තිස්සේ යොදා ගෙන ඇති පල්ල ගිය තුරුම්පුවකි. ඇත්ත වසයෙන් ම, එල්ටීටීඊය සර්ව-පාක්ෂික සාකච්ඡාවලින් ඉවත් කෙරෙනු ඇත. යුද්ධය මගින් බලාත්කාරයෙන් පවත්වා ගෙන යන “ඒකීය රාජ්‍යයේ” මගින් දෙමල ජනයා පිරිහෙලා ඇත්තේ භාෂාව හා ආගම අතින් මෙන් ම අධ්‍යාපනය, ව්‍යාපාර හා රැකියා යන ක්ෂේත්‍රයන්හි ද වෙනස්කම්වලට භාජනය කෙරුනු දෙවන පන්තියේ පුරවැසියන් බවට ය.

එල්ටීටීඊය සමග සාකච්ඡා කිරීම පිනිස “නිශ්චිත කාල සටහනක් හා නිශ්චිත න්‍යාය පත්‍රයක්” අවශ්‍ය යැයි රාජපක්ෂ කියා සිටී. “බෙදුම්වාදය අත් හැරීම, අවිහරනය, ප්‍රජාතන්ත්‍රවාදයට පිවිසීම, අවසන් විසඳුම, එය ක්‍රියාත්මක කිරීම යන සියල්ල පිලිබඳව විවෘත න්‍යාය පත්‍රයකට ඔවුන් සමග එකඟතාව ලබා ගැනීමට ක්‍රියා කරනු ඇත.” යැයි ඔහු සඳහන් කරයි. මෙය සාමය සඳහා නො ව යුද්ධය

සඳහා වන සැලසුමකි. සාකච්ඡා ආරම්භ කිරීමටත් පලමුව, ඔහු අවධාරනය කර සිටින්නේ, “අවසන් විසඳුමක් සඳහා සාකච්ඡාවක්” පිලිබඳ අපැහැදිලි පොරොන්දුවකට හිලව් වසයෙන්, එල්ටීටීඊය ආයුධ අත හැර වෙන ම දෙමල රාජ්‍ය කැබැලිත්තක් පිලිබඳ සිය ඉල්ලීම නිශ්චිතව ම ප්‍රතික්ෂේප කල යුතු බවට යි.

වික්‍රමසිංහ ආන්ඩුව සමග පැවැත්වූ සාකච්ඡා තුල දී, ෆෙඩරල් පාලන ව්‍යුහයක් හා එක්සත් ශ්‍රී ලංකාවක් ඇතුලත සීමිත ස්වයං-පාලනයකට හිලව් වසයෙන් වෙන ම දෙමල ඊලමක් පිලිබඳ සිය ඉල්ලීම අත හැරීමට එල්ටීටීඊය එකඟ විය. එවන් එකඟතාවක එල්ලය වූයේ කම්කරු පන්තිය අන්‍යොන්‍ය වසයෙන් සූරා කෑමේ සිය වැඩ පිලිවෙල තීව්‍ර කරනු පිනිස සිංහල, දෙමල හා මුස්ලිම් ප්‍රභූ කොටස් අතර බලය බෙදා ගැනීමේ සැකැස්මකි. කෙසේ වෙතත්, මිලිටරි ධූරාවලිය, බෞද්ධ භික්ෂූන්, රාජ්‍ය යාන්ත්‍රනය සහ ව්‍යාපාරික කොටස් ඇතුලු සිංහල අධිපතිවාදය පවත්වා ගෙන යාම සමග බැඳුනු අවශ්‍යතා සහිත කොලඹ පාලක පන්තියේ කොටස්වල විරුද්ධත්වය එයට එල්ල විය.

ජවිපෙ, හෙල උරුමය සහ සෙසු සිංහල අන්තවාදී පක්ෂ, “ෆෙඩරල් ව්‍යුහයට” දරුනු ලෙස විරුද්ධ වෙමින්, සාම ක්‍රියාදාමයට පහසුකම් සලසන්නන් “එල්ටීටීඊ ගැත්තන්” ලෙස හෙලා දැක්ක අතර, සුනාමි ආධාර ඒකාබද්ධව කලමනාකරනය කරනු පිනිස දරුනු සීමිත ප්‍රයත්නයන්ට පවා එරෙහිව ස්වෝත්තමවාදී උද්ඝෝෂනයක් දියත් කලේ ය. රාජපක්ෂගේ මැතිවරන ප්‍රකාශනය, “දැනට සාම සම සභාපතිවරයන් වන එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය හා නෝර්වේ සමග ද මේ අලුත් ප්‍රවේශය පිලිබඳ විවෘත සාකච්ඡාවක්” පැවැත්වීමට දුන් පොරොන්දුවක් ද ඇතුලුව, ඔවුන්ගේ සියලු ඉල්ලීම්වලට යටත් වී තිබේ.

බුද්ධාගම රාජ්‍ය ආගමක තත්වයට ඔසවාලන ව්‍යවස්ථාමය වගන්තිය පවත්වා ගෙන යාමට පමනක් නො ව, එය පුලුල් කිරීමට ද තමන් ක්‍රියා කරන බව රාජපක්ෂ අවධාරනය කිරීම අර්ථභාරී ය. “පන්සල-පල්ලිය-කෝවිල වෙත සමීප” වීමට ජනතාව දිරිගන්වන අතර, මැතිවරන ප්‍රකාශනය කියා සිටින්නේ, “බුදු සසුනට ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති ප්‍රමුඛස්ථානය තහවුරු” කෙරෙන බව යි. මෙය පොලීසිය හා ආරක්ෂක හමුදාවන් ශක්තිමත් කිරීම සමග එක පෙලට යයි.

වික්‍රමසිංහට මෙන් ම, රාජපක්ෂට ද යුද්ධය සඳහා, සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අභිලාෂයන් හා සමාජ අවශ්‍යතා සපුරාලන විසඳුමක් නැත. ඔහුගේ “නැවුම් ප්‍රවේශය”, අවශ්‍ය නම් අතිශයින් ම ප්‍රජාතන්ත්‍ර විරෝධී විධි ක්‍රම යොදා ගනිමින්, වර්ගවාදී ව්‍යවස්ථාව සහ සිංහල බෞද්ධ අධිපතිවාදය පවත්වා ගෙන යාම පිනිස යුද්ධය යලි ඇවිලවීම සඳහා සූදානම් වීමක් මිස අනෙකක් නො වන බව ඔප්පු වේ.

යුද්ධයට හා සමාජ අසමානතාවට සමාජවාදී විකල්පයක් ඉදිරිපත් කරනු පිනිස සමාජවාදී සමානතා පක්ෂයේ ජනාධිපති අපේක්ෂක ලෙස මම තරග වදිමි. පහත දැක්වෙන පිලිවෙත් සඳහා සටන් වදින ලෙස අපි වැඩ කරන ජනතාවගේ ඉල්ලා සිටිමු.

“ දිවයිනේ උතුරු හා නැගෙනහිර පලාත්වලින් සියලු ම ආරක්ෂක හමුදා වහා ම හා කොන්දේසි විරහිතව ඉවත් කරන ලෙස ඉල්ලා සිටිනු. ඒකීය රාජ්‍යය බලාත්කාරයෙන් පවත්වා ගෙන යාමෙහි ප්‍රතිඵලය වී ඇත්තේ, දෙමල සුලුතරයට එරෙහිව වෙනස්කම් කිරීමේ පිලිවෙත මුල් බැස ගැනීම සහ මිලිටරිවාදය හා මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ප්‍රහාර දිවයින පුරා ම ආධිපත්‍යය දැරීම යි.

“ සියලු ම ආකාරයේ පීඩනයන්ට එරෙහි වනු, ජනවර්ගය, භාෂාව හා ආගම නොතකා සියල්ලන්ගේ ම අයිතීන් වෙනුවෙන් සටන් වදිනු. යුද්ධය අවසන් කිරීමේ විසඳුමක් වර්ගෝත්තමවාදය හා ඒකාධිපති විධායක ජනාධිපති තනතුර ස්ථාපිත කරන ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව ප්‍රතික්ෂේප කිරීමක් ඉල්ලා සිටී. ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳ සියලු ම ප්‍රමුඛ ගැටලු ගැන තීන්දු කිරීමේ අවස්ථාව ධනපති දේශපාලනඥ කල්ලි නො ව සාමාන්‍ය වැඩ කරන ජනයාට ලබා දෙනු පිනිස අව්‍යාජ නියෝජනයකින් යුත් ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක් පිහිටුවිය යුතු යැයි සසප ඉල්ලා සිටී.

“ සමාජවාදී පිලිවෙත් සඳහා සටන් වදිනු. ප්‍රජාතන්ත්‍ර අයිතීන්ගේ ආරක්ෂාව සමාජ සමානතාව සඳහා අරගලය සමග බැඳී පවතී. කම්කරු පන්තිය විසින් නිර්මිත ධනය සංගතවල ලාභ තර කිරීම පිනිස නො ව, බහුතරයකගේ දැවෙන සමාජ අවශ්‍යතා සපුරාලනු පිනිස යොදා ගත හැකි වන පරිදි, සමජය ඉහල සිට පහලට ප්‍රතිසංවිධානය කල යුතු ය. දකුනු ආසියාවේ එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා වූ පුලුල් අරගලයක සහ ධනවාදය අහෝසි කිරීමේ ගෝලීය අරගලයේ කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක් ගොඩ නැගීම පිනිස සසප සටන් වදී.

අන් සියල්ලට ම වඩා, මේ සඳහා අවශ්‍ය වන්නේ, මෙම ඓතිහාසික කර්තව්‍යයන් ඉටු කරනු පිනිස කම්කරු පන්තියේ නව මහජන පක්ෂය ලෙස සසප ගොඩ නැගීම යි. අපගේ උද්ඝෝෂනයට සහයෝගය දෙන ලෙසත් අපගේ ක්‍රියාමාර්ගය බැරෑරුම්ව අධ්‍යයනය කොට සසපට බැඳීමට ඉල්ලුම් කරන ලෙසත් කම්කරුවන්ගෙන්, තරුනයන්ගෙන් හා බුද්ධිමතුන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

© www.wsws.org